සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2729

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :............................................ විභාග අංකය :............................

සැලකිය යුතුයි :
- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) මිනිසාට ලබා දී ඇති අල්ලාහ්ගේ අති මහත් දායාදයන් දෙකකි.

(1) අධ්‍යාපනය - ඥානය (2) හැසිරීම - යහගුණ
(3) සම්පත් - ආරෝග්‍යය (4) ආරෝග්‍යය - විවේකය

(02) කලීෆා අබුබක්කර් (රළි) තුමාගේ පාලන කාලය

(1) අවුරුදු 8යි. (2) අවුරුදු 2යි.
(3) අවුරුදු 4යි. (4) අවුරුදු 10යි.

(03) උම්මාහතුල් මුඃමිනීන් යනු,

(1) තරුණ සහාබිවරු (2) නබි මිතුරන්
(3) නබිතුමාගේ බිරින්දෑවරුන් (4) මුඃමින් කාන්තාවන්

(04) නබි (සල්) තුමා විවාහ වූ කන්‍යා ස්ත්‍රිය,

(1) හෆ්සා (රළි) (2) සෆියා (රළි)
(3) මෛමූනා (රළි) (4) ආයිෂා (රළි)

(05) 'වහි කයිරු මත්ලුවු' යනුවෙන් හැඳින්වන්නේ,

(1) අල්-කුර්ආනය (2) අල්-හදීස්
(3) අල්හෆර් (4) අන්-නබි

(06) අල්ලාහ් තමන් ප්‍රිය කරන අයට ලබාදෙන භාග්‍ය,

(1) සැප සම්පත් (2) අධ්‍යාපන ඥානය
(3) ශරීර සෞඛ්‍යය (4) මානසික ශක්තිය

(07) "කලීලුල්ලාහ්" යන විශේෂ නමින් අමතනු ලැබූ නබි,

(1) මූසා (අලෛ)
(2) ඊසා (අලෛ)
(3) ඉබ්රාහිම් (අලෛ)
(4) නූහ් (අලෛ)

(08) අල්-අස්ර් යන පදයේ අර්ථය වනුයේ,

(1) ෆර්ල්
(2) සුන්නත්
(3) කාලය
(4) ෂර්ත්

(09) 'ඉය්යාකනඃබුදු' යන්නෙහි තේරුම,

(1) ඔබම නමදිමු.
(2) ඔබගෙන් සහය පතමු.
(3) ඔබ ව පිළිගනිමු.
(4) ඔබගෙන් පමණක් පිහිට පතමු.

(10) 'තවද සැබැවින් ම නුඹ අතිශ්‍රේෂ්ඨ ගුණාංගය මතය' යනු

(1) කුර්ආන් වැකියකි.
(2) අල්-හදීස් වැකියකි.
(3) සහබාවරුන්ගේ ප්‍රකාශයකි.
(4) උගතුන්ගේ ප්‍රකාශයකි.

(ලකුණු 2 × 10 = 20)

(02) වඩාත් සුදුසු පදය ගලපන්න.

| | | |
|---|---|---|
| (1) | පළමුවන අත්තහියය්යාත් ඉඳුම | අත්තව්වාබ් |
| (2) | සමාජ ශුභ සාධන සංවිධානය | ඉෆ්තිරාෂ් |
| (3) | අතිශයින්ම පව් සමාව පිළිගන්නා | මහ්රම් |
| (4) | විවාහ වීමට අනුමත නොකළ අය | වලීමා |
| (5) | මනාලයා විසින් දෙන විවහ සංග්‍රහය | හිල් ෆුල් ෆුලුල් |

(ලකුණු 2 × 5 = 10)

(03) වඩාත් සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

(1) හිජ්රතයට පසු මදිනාවේ, මුහාජිරින්වරුන්ට පළමුව ඉපදුන දරුවා ..............................................................................................................

(2) ඉබ්නු අබ්බාස් (රළි) තුමා .............................................. කලාවේ ශ්‍රේෂ්ඨයෙකු වූවේය.

(3) බිරිඳගේ සහෝදරිය විවහ කර ගැනීමට ඉස්ලාම් ............................................................ තහනම් කර ඇත.

(4) අල්ලාහ් පවසයි යනුවෙන් නබි (සල්) තුමා විසින් පවසන ලද හදීස් ................................................... වේ.

(5) නබි (සල්) තුමා නොපැවසු හෝ අනුමත නොකළ පුවත් එතුමාගේ නාමයෙන් ගොතන ලද හදීස් .......................... ........................................ වේ.

(ලකුණු 2 × 5 = 10)

## II කොටස

- ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) අල් - කුර්ආනය හා හදීස් කුද්සි අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(2) දිවට පහසු වූ ද තරාදියට බර වූ ද අල්ලාහ්ට ඉතා ප්‍රියතම වචන දෙකක් ඇත්තේ ය. එම වචන දෙක කුමක් ද?

(3) 'අස් - සිහාහුස්සිත්තා' අන්තර්ගත වන හදීස් ග්‍රන්ථ මොනවා ද? (ලකුණු 3 + 3 + 6 = 12)

(02) (1) කරුණු දෙකක් පිළිබඳව එකිනෙකාට උදවු වන ලෙස අල්ලාහ් අවධාරණය කරන්නේ ය. එම කරුණු දෙක කුමක් ද?

(2) සමූහ සේවා කොටසේ අඩංගු වන සමාජ සේවා තුනක් සඳහන් කරන්න.

(3) අපගේ මුතුන් මිත්තන් පොදු දේපළ ආරක්ෂා කරමින් ජීවත් විය. එවැනි කෙනෙකුගේ සිද්ධියක් ලියා දක්වන්න. (ලකුණු 3 + 3 + 6 = 12)

(03) (1) සහීහ් වන හදීස් හි දැකිය හැකි වැදගත්කම ගුණාංග දෙක ගෙන හැර දක්වන්න.

(2) හදීස් ව්‍යාජ ලෙස ගෙතීම් කරන්නන්ට නබි (සල්) තුමා කළ අවවාදය කුමක් ද?

(3) මව්ලූඃ වන හදීස් විවිධ අරමුණු මත බිහි විය. ඒවා තුනක් සඳහන් කරන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

(04) (1) සලාතය විධිමත්ව ඉටු කළ කෙනෙකුට පරලොවේදී ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(2) සලාතය මගින් අප ලබන මෙලොව ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(3) රමළානයේ අනුගමනය කරන ලෙස ඉස්ලාම් පෙන්වා දෙන යහපත් ක්‍රියා 6ක් ලියන්න.

(ලකුණු 3 + 3 + 6 = 12)

(05) ජීවිතයේ වළක්වා ගත යුතු දුර්ගුණාංග 6ක් ද එම ගුණාංගවලින් ජීවිතයේ ඇතිවන බලපෑම් 6ක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 12)

(06) උම්මාතුල් මුඃමිනීන් වන සව්දා (රළි) තුමිය ගැන වාක්‍යය 12ක් ලියන්න. (ලකුණු 12)

(07) නබි ඉබ්රාහීම් (අලෛ) තුමා ගැන කෙටි රචනාවක් ලියන්න. (ලකුණු 12)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | පිළිතුරු |

## I කොටස

(01) (01) 4 (02) 2 (03) 3 (04) 4 (05) 2

(06) 2 (07) 3 (08) 3 (09) 1 (10) 1

(02) (01) 2 (02) 5 (03) 1 (04) 3 (05) 4

(03) (01) අබ්දුල්ලාහ් ඉබ්නු සුබෙයිර් (02) තෆ්සීර් (03) තාවකාලික

(04) හදීස් කුද්සි (05) මව්ලූඃ

## II කොටස

(01) (1) පෙළ පොතේ පිටු අංක 130
(2) පෙළ පොතේ පිටු අංක 125
(3) පොදු වස්තූන් පාඩම

(02) (1) පෙළ පොතේ පිටු අංක 125
(2) පෙළ පොතේ පිටු අංක 121
(3) 30 වන පාඩම

(03) (1) පෙළ පොතේ පිටු අංක 90
(2) පෙළ පොතේ පිටු අංක 92
(3) පෙළ පොතේ පිටු අංක 93-94

(04) (1) පෙළ පොතේ පිටු අංක 16-17
(2) පෙළ පොතේ පිටු අංක 18-19
(3) පෙළ පොතේ පිටු අංක 37

(05) (1) පෙළ පොතේ පිටු අංක 55
(2) පෙළ පොතේ පිටු අංක 106
(3) 27 වන පාඩම